# විරැකියාව කළමනාකරණය උදෙසා වෘත්තීය අභිප්‍රේරණයෙහි වැදගත්කම පිළිබඳ පාලි මූලාශ්‍රය ඇසුරින් අධ්‍යයනයක්

බැරගම ශ්‍රී රාහුල හිමි[1]

## හැඳින්වීම

නූතන සමාජයේ විරැකියාව බරපතළ සමාජ ගැටලුවක් ලෙස පවතින බව මහබැංකු වාර්තා අධ්‍යයන කිරීම මගින් පැහැදිලි වෙයි. ප්‍රධාන වශයෙන් විරැකියාවෙහි කොටස් හතරකි. එනම් ඝර්ෂණාත්මක විරැකියාව, චක්‍රිය සේවා විරැකියාව, ව්‍යුහාත්මක සේවා විරැකියාව ආයතනික සේවා විරැකියාව වශයෙනි. විරැකියාව සඳහා විසඳුම් සෙවීමේදී සාම්ප්‍රදායික ආර්ථික විසඳුම්වලට අමතරව, පුද්ගල අභිප්‍රේරණය සහ වෘත්තීය ආචාරධර්ම පිළිබඳ ගැඹුරු අවබෝධයක් අවශ්‍ය වේ. පාලි මූලාශ්‍රයන්හි, විරැකියාවට මූලික හේතුවක් ලෙස අලස බව සහ ධනය උපයා ගැනීමට උත්සාහ නොකිරීම දක්වා ඇති අතර, ඊට ප්‍රතිවිරුද්ධව උත්සාහය සහ ධර්මානුකූල ජීවනෝපාය වැනි අභිප්‍රේරණ ගුණාංගවල වැදගත්කම අවධාරණය කර ඇත. මෙම පාලි මූලාශ්‍රයන්හි අන්තර්ගත වෘත්තීය අභිප්‍රේරණ සංකල්ප සහ සම්මා ආජීවය වැනි සංකල්ප නූතන සමාජ ගැටලුවක් වන විරැකියාව කළමනාකරණය සඳහා ඵලදායී ලෙස යොදා ගත හැකි ආකාරය පිළිබඳව විමර්ශනාත්මක විශ්ලේෂණයක අවශ්‍යතාවක් පවතී. විරැකියාව සඳහා හේතු හඳුනාගැනීම, බෞද්ධ ඉගැන්වීම අනුව වෘත්තීය අභිප්‍රේරණ ගුණාංග පාලි මූලාශ්‍රය ඇසුරින් විචාරාත්මකව විශ්ලේෂණය කිරීම සහ විරැකියාවෙන් පෙළෙන ශ්‍රම බලකාය තුළ වෘත්තීය අභිප්‍රේරණය වැඩි දියුණු කිරීම සඳහා පාලි මූලාශ්‍රය මගින් ලබාගත් බෞද්ධ සංකල්ප නූතන කළමනාකරණ වැඩසටහන්වලට ඒකාබද්ධ කළ හැකි ආකාරය පිළිබඳව මෙම පර්යේෂණයෙන් සිදු කෙරේ.

## පර්යේෂණ ගැටලුව

නූතන සමාජයේ පුද්ගල මානසික ආතතියට මෙන්ම අපරාධ සහ දේශපාලන අස්ථාවරත්වයට ප්‍රධාන හේතුවක් වන විරැකියාව නැමැති සංකීර්ණ ගැටලුව කළමනාකරණය කිරීම සඳහා පාලි මූලාශ්‍රය දැක්වෙන වෘත්තීය අභිප්‍රේරණය හා නිවැරදි ජීවනෝපාය පිළිබඳ බෞද්ධ සංකල්ප නූතන ප්‍රවේශයක් ලෙස යොදාගත හැකි ආකාරය විමසා බැලීම මෙහි පර්යේෂණ ගැටලුවයි.

## පර්යේෂණ අරමුණු

පාලි ත්‍රිපිටක මූලාශ්‍රයන්හි අන්තර්ගත වන වෘත්තීය අභිප්‍රේරණය පිළිබඳ මගපෙන්වීම් සහ සිද්ධාන්ත හඳුනා ගැනීම.

1 පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, baragamarahul@gmail.com

බෞද්ධ ආර්ථික දර්ශනය තුළින් විරැකියාව සහ දරිද්‍රතාව පිටුදැකීම සඳහා ඉදිරිපත් කර ඇති ප්‍රායෝගික ක්‍රම විශ්ලේෂණය කිරීම.

නූතන ශ්‍රී ලාංකීය සමාජය මුහුණ දෙන විරැකියා අර්බුදය කළමනාකරණය කිරීම උදෙසා පාලි මූලාශ්‍රයාගත උපදේශනය ප්‍රායෝගිකව උපයෝගි කරගත හැකි ආකාරය පිළිබඳ ආදර්ශයක් සැපයීම.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය මත පදනම්ව සිදු කර ඇත. මෙහිදී ප්‍රාථමික දත්ත මූලාශ්‍රය ලෙස පාලි ත්‍රිපිටකයට අයත් දීඝනිකාය, අංගුත්තරනිකාය සහ සංයුත්තනිකාය වැනි මූලික සූත්‍ර දේශනා පරිශීලනය කරන ලදි. ද්විතීයික දත්ත මූලාශ්‍රය ලෙස අදාළ අටුවා ග්‍රන්ථ, ටීකා, බෞද්ධ ආර්ථික විද්‍යාව සහ මනෝවිද්‍යාව පිළිබඳ ලියැවුණු ශාස්ත්‍රීය ලිපි සහ ග්‍රන්ථ භාවිතයට ගැනුණි. එකතු කරගත් දත්ත විශ්ලේෂණය කිරීම සඳහා ප්‍රාථමික පාඨ ග්‍රන්ථ විශ්ලේෂණ ක්‍රමවේදය (Textual and Content Analyses) උපයෝගි කරගන්නා ලදි.

**සාකච්ඡාව සහ ප්‍රතිඵල**

පාලි මූලාශ්‍රයාගත දත්ත සහ සූත්‍ර දේශනා සූක්ෂම ලෙස විශ්ලේෂණය කිරීමේ දී, වෘත්තීය අභිප්‍රේරණය වර්ධනය කිරීම සහ විරැකියා අර්බුදය මගහරවා ගැනීම සම්බන්ධයෙන් අතිශය වැදගත් වූත්, ප්‍රායෝගික වූත් කරුණු රැසක් අනාවරණය කරගත හැකිය. මෙහිදී මූලික වශයෙන්ම හඳුනාගත හැකි වූයේ බුදුදහම තුළ කර්මාන්ත හෝ වෘත්තීන් පහත් කොට නොසලකා, දැහැමි ඕනෑම රැකියාවක නිරත වීම අගය කොට ඇති බවයි. ව්‍යග්ඝපජ්ජ වැනි සූත්‍ර දේශනාවලට අනුව, ධනය උපයන පුද්ගලයා තමා නිරත වන වෘත්තිය ගොවිතැන, වෙළෙඳාම, රාජ්‍ය සේවය හෝ වේවා, එහි දක්ෂයෙකු (දක්ඛො) මෙන්ම අලස නොවන (අනලසො) අයෙකු විය යුතුය. එමෙන්ම තමා කරන කාර්යය පිළිබඳ විමසා බැලීමේ නුවණින් හා එය ක්‍රමවත්ව සංවිධානය කිරීමේ උපක්‍රමශීලී ශක්තියෙන් (උපාය වීමංසාය සමන්නාගතො) යුක්ත විය යුතු බව බුදුරජාණන් වහන්සේ වදාරා ඇත. මෙම 'උට්ඨාන සම්පදා' හෙවත් නොපසුබට උත්සාහය පිළිබඳ සංකල්පය, නූතන කළමනාකරණ විද්‍යාවේ සහ මනෝවිද්‍යාවේ දැක්වෙන පුද්ගලයාගේ අභ්‍යන්තර වෘත්තීය අභිප්‍රේරණය (Internal Professional Motivation) සමග ඍජුවම සමපාත වන බව මෙම පර්යේෂණයේ දී තහවුරු වේ. රැකියාවක සාර්ථකත්වය රඳා පවතින්නේ බාහිර බලපෑම් මත නොව පුද්ගලයා තුළ පවතින මෙම සහජ උනන්දුව සහ කැපවීම මත බව මින් පැහැදිලි වේ. එමෙන්ම ව්‍යවසායකත්ව අභිප්‍රේරණය (Entrepreneurial Motivation) සහ ප්‍රාග්ධන කළමනාකරණය පුද්ගල දියුණුවට මෙන්ම විරැකියාව පිටුදැකීමට බලපාන ආකාරය ද දත්ත ඇසුරින් අනාවරණය වේ. සිගාල සූත්‍රයේ දැක්වෙන පරිදි, මී මැස්සා මල නොතලා රොන් ගන්නා සේ (භමරස්සෙව ඉරීයතො) උපයන ධනය සූක්ෂම ලෙස කොටස් හතරකට බෙදා වෙන් කළ යුතු ය. එහිදී වඩාත්ම කැපී පෙනෙන කරුණ වන්නේ, උපයන සමස්ත ධනයෙන් අඩක්ම (කොටස් දෙකක්) නැවත තමාගේ ව්‍යාපාර, කෘෂිකාර්මික හෝ නිෂ්පාදන කටයුතු පුළුල් කිරීම සඳහා ආයෝජනය කළ යුතු බව (කම්මන්තෙ පයොජයෙ) දක්වා තිබීමයි. මෙමගින් පැහැදිලි වනුයේ නූතන ආර්ථික විද්‍යාවේ දැක්වෙන නැවත ආයෝජනය (Re investment) සහ ව්‍යාපාර ප්‍රාග්ධනය

උපරිම කරමින් නව රැකියා අවස්ථා උත්පාදනය කිරීමට අවශ්‍ය කරන ව්‍යවසායකත්ව මානසිකත්වය බෞද්ධ මූලාශ්‍රය තුළින් මනාව අභිප්‍රේරණය කර ඇති බවයි. මීට අමතරව, රටක පවතින විරැකියා ගැටලුව හුදෙක් පුද්ගල සාධක මතම පමණක් නොව, රාජ්‍ය ප්‍රතිපත්ති සහ මැදිහත්වීම් මත ද තීරණය වන බව පාලි මූලාශ්‍රය විමර්ශනයේ දී මනාව ගම්‍ය වේ. දීඝනිකායේ කූටදන්ත සූත්‍රයට අනුව රටක පවතින විරැකියාව, දුප්පත්කම සහ ඒ ආශ්‍රිතව හටගන්නා අපරාධ රැල්ල මැඩලීම සඳහා වැරදිකරුවන්ට දඬුවම් දීම හෝ බදු බර පැටවීම ප්‍රායෝගික විසඳුමක් නොවේ. ඒ වෙනුවට රජය විසින් නිෂ්පාදන ආර්ථිකයක් සඳහා සක්‍රීයව මැදිහත් විය යුතු ය. ඒ අනුව කෘෂිකර්මාන්තයේ හා සත්ත්ව පාලනයේ යෙදෙන්නන්ට අවශ්‍ය බීජ, පොහොර සහ උපකරණ ද, වෙළෙඳාම් සහ ව්‍යවසායකත්ව කටයුතුවල නිරත වන්නන්ට අවශ්‍ය මූලික ප්‍රාග්ධනය (බීජ භත්තං) ද, රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට ඔවුන්ගේ ජීවන මට්ටමට සරිලන සුදුසු වැටුප් හා දීමනා ද රජය විසින් ක්‍රමවත්ව සැපයිය යුතු ය. මෙලෙස රාජ්‍ය මට්ටමින් සම්පත් සහ යටිතල පහසුකම් සැපයීම  තුළින් පුරවැසියන් තුළ තමන් සිදුකරන රැකියාව කෙරෙහි ඉහළ වෘත්තීයමය අභිප්‍රේරණයක් සහ සුරක්ෂිතතාවක් ගොඩනැගෙන බවත් එහි ප්‍රතිඵලයක් ලෙස රටක විරැකියා අනුපාතිකය සාර්ථකව අවම කරගත හැකි බවත් මෙම අධ්‍යයනය මගින් පෙන්වා දෙන ප්‍රධානතම ප්‍රතිඵලයකි.

**නිගමනය**

නූතන ලෝකයේ විරැකියාව යනු හුදු ආර්ථික ප්‍රශ්නයක් පමණක් නොව, එය පුද්ගල මානසික බිඳවැටීමට සහ සමාජයීය පරිහානියට මග පාදන්නකි. වත්මන් ශ්‍රී ලාංකීය තාරුණ්‍යය තුළ පවතින රැකියා විරහිතභාවයට ප්‍රධාන හේතුවක් වනුයේ රාජ්‍ය අංශයේ රැකියා කෙරෙහි පමණක් බලාපොරොත්තු තබාගෙන ස්වයං රැකියා හෝ ව්‍යවසායකත්ව අභිප්‍රේරණයෙන් තොර වීමයි. පාලි මූලාශ්‍රය සපයන ආදර්ශයන්ට අනුව, රැකියාවක නිරත වීම යනු හුදු මූල්‍යමය ලාභ ඉපැයීමක් පමණක් නොව, එය උසස් මානසික තෘප්තියක් මෙන්ම ආධ්‍යාත්මික දියුණුවට ද පදනමකි. රජය විසින් සහනාධාර මත යැපෙන සමාජයක් බිහි කිරීම වෙනුවට, කූටදන්ත සූත්‍රයේ දැක්වෙන පරිදි නිෂ්පාදන ආර්ථිකයකට අවශ්‍ය මූලික ප්‍රාග්ධනය සහ යටිතල පහසුකම් සලසා දෙන්නේ නම්, පුද්ගලයා තුළ ස්වයංක්‍රීයවම වෘත්තීය අභිප්‍රේරණයක් ඇති වේ. ඒ අනුව පාලි මූලාශ්‍රයාගත බෞද්ධ ආර්ථික ඉගැන්වීම් නූතන විරැකියා අර්බුදය සාර්ථකව කළමනාකරණය කිරීම සඳහා භාවිත කළ හැකි සර්වකාලීන ප්‍රායෝගික මාර්ගෝපදේශකත්වයක් සපයන බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද** - අභිප්‍රේරණය, අලසබව, පුද්ගලයා, විරැකියාව, සමාජය

**ආශ්‍රිත ග්‍රන්ථ**

*අංගුත්තරනිකාය ii,* (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර්මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*අංගුත්තරනිකාය iii,* (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර්මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*අංගුත්තරනිකාය iv,* (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර්මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*අංගුත්තරනිකාය v,* (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර්මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*ඛුද්දකනිකාය,* (2006). පේතවත්ථුපාළිය. බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර්මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*දීඝනිකාය iii,* (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*සංයුත්තනිකාය iv,* (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර්මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

කරුණාරත්න, එච්. ඩී. (2009). *ප්‍රායෝගික ආර්ථික විද්‍යාව.* නුගේගොඩ: නියෝ ග්‍රැෆික්ස්.

Bolles, R. C. (1967). *Theory of motivation*. New York: Harper & Row.

Maslow, A. H. (1970). *Motivation and personality*. New York: Harper and Row.